# අභයගිරි විහාරයේ භික්ෂු සමූහය හා ආරාමික කළමනාකරණය

එච්. ඒ. නිලංක උදාර ජයරත්න

මෙරට ඓතිහාසික, ආගමික මූලස්ථාන කිහිපය අතුරින් අභයගිරි විහාරය යනු සුවිශේෂී දේශපානික හා ආගමික සාධක මත ගොඩනැගුණු විහාරාරාමයකි. අනුරාධපුර රාජධානිය තුළ අගනගරයේ ඉදිවුණු විහාර, පරිපාලන හා වාස්තුවිද්‍යාත්මක සාධක මත ප්‍රධන වර්ග තුනක් වශයෙන් වර්ග කළ හැකි ය.

01. මහා විහාර
02. පියන්ගල් විහාර
03. පබ්බත විහාර වශයෙනි.

ඒ අතර අභයගිරි විහාරය ''මහා විහාර'' ගණයට ගැණිය හැකි ය. වට්ටගාමිණී අභය (ක්‍රිඃපූඃ 89-77) රාජ්‍යත්වයට පත් ව සිටිය දී මුහුණ දීමට සිදු වූ ඊිය බ්‍රාහ්මණයාගේ ආක්‍රමණය හා දකුණු ඉන්දියානු සොළී ආක්‍රමණය ප්‍රධාන සාධක වෙමින් මෙම විහාරාරාමයක් ඉදි විය. මෙම විහාරය නිර්මාණය වීම සඳහා සමකාලීන දේශපාලනික තත්වය ප්‍රධාන වශයෙන් මූලික ව බලපා ඇති බව එයින් පැහැදිලි ව හඳුනාගත හැකි ය. අභයගිරි විහාරයයේ ආරම්භය ශාසන ඉතිහාසයේ වැදගත් සිදු වීම දෙකක් පිළිබිඹුවන අවස්ථාවකි. පළමු කරුණ නම් පුද්ගලික ආරාම පූජාවක් වශයෙන් කුපික්කල තිස්ස හිමියන් අභයගිරිය පිළිගැනීම ය. එම කරුණ මූලික කරගනිමින් මහාවිහාර භික්ෂූන් කුපික්කල තිස්ස හිමියන් ව පොහොය ගෙයින් නෙරපීම මත නිකාය භේදය ඇති වීම දෙවන කරුණ යි. දෙවන කරුණට හේතු කරුණු හඳුනාගැනීමේ දී මෙම සිදුවීම දක්වා විහාරාරාම භික්ෂූන් විසින් පිළිගත් පිළිවෙත පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය.

මිහිඳු හිමියන් මෙ රටට වැඩමවීමත් සමග ඇති වූ විහාරාරාම ඉදිවීම හා සංඝයාට පූජා කිරීම සඳහා ''අගත අනගත චතුදිශ ශගශ'' වශයෙන් 'පැමිණි නො පැමිණි සතර දෙසින් වඩින භික්ෂූන්ට' යන සාංඝික ක්‍රමය භාවිත කොට ඇත **(ගුණවර්ධන, පි. 56).** ඒ බවට එම යුගයේ පූජාවන් ලෙස හඳුනාගෙන ඇති මිහින්තලා හා වෙස්සගිරිය වැනි පැරණි ලෙන් ලිපි සාක්ෂි දරයි **(ශිලාලේඛන සංග්‍රහය, පි 11.).** එහෙත් අභයගිරි විහාර පූජාව සිදු වන්නේ මෙම සම්ප්‍රදයට හාත්පසින් ම වෙනස් ව, පුද්ගලික ආරාම පූජාවක් වශයෙනි. ඒ සඳහා හේතු වූ මූල බීජයන් **මහාවංශය** තුළ ම සවිස්තර ව සඳහන් වේ.

**මහාවංශයේ** වට්ටගාමිණී අභය රජු සොළී ආක්‍රමණය හමු වේ පසු බැස පලායාමත් සමග කුපික්කල මහා තිස්ස තෙරුන් රජුට උපකාර කළ ආකාරයත්, වැටකේ පතක ලියා තෙරුන් වැඩ සිටි විහාරයට සංඝභෝග පිරිනැමීමත් සඳහන් වේ **(මහාවංශය,33:77)**. එහි ආරම්භක අවස්ථාව ගිරි නිගණ්ඨයා රජුට අපහාස කළ විට නැවත රාජ්‍යත්වයට පත් වූ පසු මෙම නිගණ්ඨාරාමය බිඳ බෞද්ධ විහාරයක් ගොඩනගන බවට රජු විසින් කළ අධිෂ්ඨානය යි. අධිෂ්ඨානය අනුව ගිරි නිගණ්ඨාරාමය බිඳ බෞද්ධ විහාරයක් ඉදි කරන ලදි. එම විහාරය තමන්ට දුෂ්කර ම අවස්ථාවේ උපකාර කළ කුපික්කල තිස්ස හිමියන්ට පුද්ගලික ව ම පූජා කිරීම රජු විසින් සිදු කර ඇත. මෙම සිදු වීම මහා විහාරය පිහිටුවා වසර 215ක් හා දස මසකට පසු ව සිදු වූ බව තව දුරටත් සඳහන් ය **(මහාවංශය,33:83-84)**. මෙම සිදු වීම පදනම් කරගනිමින් "කුලයන් හා සංසර්ග කර්මය" ට වරදකරු කරමින් මහා විහාරවාසී අනෙකුත් මහතෙරවරුන් පොහොයගෙයින් මහතිස්ස තෙරුන් නෙරපීමට කටයුතු කර ඇත **(මහාවංශය,33:97-98)**. මෙහි දී එම හිමියන්ගේ ශිෂ්‍ය, **බහලමස්සුතිස්ස** තෙරුන් ඇතුළු භික්ෂූන් 500ක් වූ කණ්ඩායම මහා විහාරයෙන් වෙන් ව අභයගිරිය විහාරයට යැමට කටයුතු කරයි **(මහාවංශය,33:99)**.

මේ සිදු වීමට පෙර එක ම භික්ෂු කණ්ඩායමක් වශයෙන් 'සමූහය' යන අර්ථයෙන් පැවති 'නිකාය' යන වචනයට නව අරුතක් සපයමින් ඉන් අනතුරු ව 'මතවාදී සමූහයක්' හඳුනාගැනීමට 'නිකාය' යන වචනය භාවිත කර ඇත **(ගුණවර්ධන,පි.01:07)**. v වන කාශ්‍යප රජුගේ (ක්‍රි:ව: 929-39) අභයගිරි පුවරු ලිපියේ සිලාමේඝවණ්ණ පබ්බත විහාර පූජාව පිළිබඳ ව සඳහන් කිරීමේ දී ''වසවය් සතර පස සුලබ් කොට් මෙමෙ නකය් අබදි අවසට්'' **(සිලාලේඛන සංග්‍රහය, පි. 27)** වශයෙන් 'සිව්පසය සුලභ කොට මෙම නිකාය අනුබද්ධ අවාසයන්ට' ලෙස ද, කපාරාමූල සංස්කෘත සෙල්ලිපියේ වැඩ විසිය යුතු භික්ෂූන් ගැන දැක්වීමේ දී ''චාතුර්මහා නිකායේෂු පඤ්චවිංශතිඃ පඤ්චවිංශතිසතප'' **(සිලාලේඛන සංග්‍රහය,පි.01)** හෙවත් 'සතර මහා නිකායන්ගෙන් විසිපස් නම බැගන් විසිය යුතු' ලෙස ද වන සඳහනින් එම අදහස තව දුරටත් තහවුරු වේ. ඒ අනුව අභයගිරි ආරාම පූජාව මෙම සංඝ භේදය හෙවත් නිකාය භේදය ඇති වීමට මෙ රට පළමු සාධකය ලෙස සඳහන් වේ. **(මහාවංශය,33:100)**

අභයගිරි නාමය හා වැඩ සිටි භික්ෂු සමූහය පිළිබඳ ව මතිමතාන්තර රාශියකි. අභයගිරි නාමය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරන ප්‍රාථමික මූලාශ්‍රයක් වන මහාවංශයේ සඳහන් වනුයේ විහාරය ඉදි කළ වට්ටගාමිණී රජුගේ 'අභය' කොටස හා රජුට අපහාස කළ ගිරි නිඝණ්ටයාගේ 'ගිරි' කොටස ද එක් ව ''අභයගිරිය'' නමින් විහාරය නම් කළ බවකි **(මහාවංශය,33:83-84)**. එසේ ම 14වන සියවසේ රචිත **නිකාය සංග්‍රහයේ** එන පරිදි ඉන්දියාවේ පල්ලවාරාමයේ සිට අභයගිරි විහාරයේ වාසය කිරීමට වජ්ජිපුත්තක ගුරුකුලයට අයත් ධම්මරුචි නම් භික්ෂුවගේ ගෝල පිරිස පැමිණි බවත්, ඔවුන්ගේ ඉගැන්වීම් පිළිගැනීම හේතුවෙන් අභයගිරි වාසීන් 'ධම්මරුචික' නමින් හැඳින් වූ බවත් ය **(නිකාය සංග්‍රහය,පි.13)**. එහෙත් විද්වත් මත අනුව මෙම මත

දෙක ම ඇති වීමට හේතුන් වූයේ ප්‍රතිපාර්ශ්වය විසින් තම විරුද්ධ පාර්ශ්වය පහළ දැමීමේ අරමුණින් මෙම විග්‍රය කර ඇති බව යි **(කුලතුංග පි. 1-2. ගුණවර්ධන, පි. 14-15).** පුරාවිද්‍යාත්මක සාධක මගින් අභයගිරි ස්තූපය පිහිටා ඇත්තේ කූටයක හෙවත් පර්වතයක බව හඳුනාගෙන ඇත **(පුරාවිද්‍යා කැනීම් වාර්තාව)**. ඒ අනුව කූටයට හෙවත් පර්වතයට 'ගිරි' ලෙස පාලි අර්ථය හා රජුගේ නාමයෙන් 'අභය' කොටස ද එක් ව 'අභයගිරි' නම් වූ බව මහාචාර්ය ටී. ජී. කුලතුංග පෙන්වා දෙයි **(කුලතුංග පි. 16).**

මෙම විහාරය උතර මහ චෙත, උතර විහාර, ගාමිණි උත්තර විහාර, බගිරි වෙහෙර, බයාගිරිය, අභයගිරිය යන නම්වලින් හඳුන්වා තිබේ. ආරාම දෙළසකින් යුක්ත ව ආරම්භ වූ අභයගිරි විහාරය අරම්භයේ දී කුඩා භූමියකට සීමා විය **(කුලතුංග ටී.ජී., 01 පිටු)**. එහෙත් මහා විහාරයට තරගකාරී ව වර්ධනය වූ මෙම මධ්‍යස්ථානය ක්‍රි:වː 05 වන සියවස වන විට භික්ෂූන් 5000ක් වැඩ සිටි බවත්, මහාවිහාරයේ භික්ෂූන් 3000ක් වැඩ සිටි බවත්, ෆාහියන් හිමියන් තම වාර්තාවේ දක්වයි **(samuel Beal, Chinese account of india,1957,vol:I, pp** 46-49). ඒ අනුව මේ වකවානුව වන විට සාමාජීය වශයෙන් ද අභයගිරි පාර්ශ්වය මහා විහාරය අභිභවා සිටි බව පැහැදිලි ය. ප්‍රධාන ඉදිකිරීම් වූ ස්තූපය ද මහා විහාරයේ ස්තූපයට වඩා ප්‍රමාණයෙන් විශාල ය **(samuel Beal, Chinese account of india, calcutta, 1957,vol:I, pp 46-47**). මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය වන **මහාවංශය** හා **නිකාය සංග්‍රහය** වැනි සාහිත්‍ය මූලාශ්‍රය මහා විහාර පාර්ශ්වයේ කෘති බැවින්, එයින් උත්සාහ ගෙන ඇත්තේ තම පාර්ශ්වයේ අගයන් ඉහළ නංවාගැනීමට උත්සාහ දැරීමක් ය යන විද්වත් මතය සාධාරණ බව හැඟේ.

එම තරගකාරී පරිසරය තුළ නොමඳ ව ලැබුණු රාජ්‍ය අනුග්‍රහය අභයගිරි විහාරයේ සංවර්ධනය හා විකාශනය ශක්තිමත් ව හා සීඝ්‍ර ව සිදුවීමට ප්‍රධාන සාධකයක් වූ වග මූලාශ්‍රවලින් පැහැදිලි කරගත හැකි ය. ඒ අතර පළමුවන ගජබාහු (ක්‍රි.ව. 122-134) රාජ්‍ය සමයෙහි මෙම ආරාමයෙහි ප්‍රධාන ඉදිකිරීම වන ස්තූපය විශාල කිරීමට කටයුතු කළ බවට වන සඳහන් වේ **(දීපවංශය, 35 පරි. 119 පි)**. එසේ ම මෙම ස්තූපයේ සතර ආයක කණිට්ඨතිස්ස (ක්‍රි.ව 164-192) රාජ්‍ය අවධියේ දී සිදු කළ බව අභයගිරි ස්තූප දකුණු ආයකය ඉදිරිපිට ඇති එම රජුගේ සෙල්ලිපියේ සඳහන් වේ. **(සිලාලේඛන සංග්‍රහය, i කාණ්ඩය, 131 පි.)**. මෙම විහාරයේ සංවර්ධනය සඳහා තවත් සුවිශේෂී සිදු වීමක් ඍජු ව බලපෑ ඇති බව පෙනේ. එනම් ක්‍රි:වː 5 වන සියවසේ සිදු වූ දළදාගමනය යි. සමකාලීන ව අභයගිරි පාර්ශ්වය රජුගේ වැඩි විශ්වාසය හා ප්‍රසාදය දිනා සිටි බවට සාධක වේ. දළදා වහන්සේ ජනතා වන්දනය සඳහා අභයගිරි විහාරයට පෙරහැරින් වැඩම කළ අයුරු මූලාශ්‍රයවල සඳහන් වේ. එසේ වැඩමවා තැන්පත් කර මහජන ප්‍රදර්ශනය සඳහා තැන්පත් කරන ලද ගොඩනැගිල්ල අභයගිරි දානශාලාව හා රත්නප්‍රාසාදය අතර සාධක සහිත ව නටඹුන් ව සංරක්ෂණය කර ඇත. දළදාගමනය යනු සුවිශේෂී දේශපාලනික සිදු වීමකි. එනම් දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා රහසිගත ව මෙරටට වැඩම වීම යි . ඒ අනුව මෙහි ආරක්ෂාව රජුගේ

සුවිශේෂී වගකීමක් විය. දළඳ වහන්සේ ජනතාවට වන්දනාමාන කිරීමට වගකීම අභයගිරි විහාරයට පැවරීමට තරම් අභයගිරි පාර්ශ්වය රජුගේ විශ්වාසයත්, ප්‍රසාදයත් දිනා සිටි බව පැහැදිලි ය. මෙම සිදු වීමත් සමඟ මෙතෙක් රාජ්‍ය සංකේතයක් බඳු ව පැවති ශ්‍රී මහා බෝධීන් වහන්සේට හිමි තැන දළඳ වහන්සේට හිමි වීම දැකිය හැකි තවත් සුවිශේෂ තත්වයකි. ඒ බව පසු කාලීන නිදසුනක් ලෙස මහා පරාක්‍රමබාහු (ක්‍රිːවː 1153-1186) රාජ්‍යත්යට පත් වුව ද දළඳ වහන්සේ අහිමි වීම මත ජනතාව ඔහු නීත්‍යනුකූල පාලකයෙකු වශයෙන් නො පිළිගැනීමෙන් පැහැදිලි ය **(කුලතුංග ටී.ජී. , 93 පිටු.)**

එසේ ම දළඳ වහන්සේ අරක්‍ෂා කිරීමේ අයිතිය අභයගිරියේ උත්තර මූලයට පැවරී තිබූ බවට සාධක හමු වේ. එනම් පොළොන්නරු අවධියේ දී රටේ අරක්‍ෂාවට තර්ජනාත්මක තත්වය තුළ දළඳ වහන්සේගේ අරක්‍ෂාව වේලෛක්කාර හමුදව වෙත පවරනු ලබන්නේ උත්තර මූළයේ මොග්ගල්ලාන හිමියන් විසිනි **(කුලතුංග ටී.ජී. 2000, 07 පි.)** ඒ අනුව මෙහි බලපෑමෙන් මහා විහාරයට පැවති බෞද්ධ ජනතා ප්‍රසාදය ද අභයගිරි විහාරය වෙත යොමුවීමට ද, රාජ්‍ය අනුග්‍රහය තව දුරටත් වැඩි වීමට ද හේතු වූ අයුරු හඳුනාගත හැකි ය.

එසේ ම මෙම ආරාමයෙහි ප්‍රධාන ස්මාරක වන ස්තූපය, දන ශාලාව, රත්නප්‍රාසාදය හා මහා බෝධිඝරය හා පිළිමගෙය v වන කාශ්‍යප (ක්‍රි.ව. 929-39) වන විට නිර්මාණය වී ක්‍රියාකාරී ව පැවති ඇත.(අභයගිර් වෙහෙර පිළිම ඉසා දගැබ්හි ඉසා මහබොගෙයි ඉසා රුවන් පහාහි ඉසා බත්ගෙයි ඉසා) මහාවිහාරයට තරඟකාරී ආයතනයක් වූ අභයගිරි විහාරයේ ප්‍රධාන බෝධීන් වහන්සේ භාරත බුද්ධගයාවේ මව් ශාඛාවෙන් ම බීජයක් ගෙන්වා රෝපණය කරන ලද බව ෆාහියන් වාර්තාවේ බෝමැඩ වැනුම යටතේ එන විස්තරය අනුව හඳුනාගත හැකි ය **(කුලතුංග. පි. 40)**. 1962-3 වර්ෂවල මෙම පරිශ්‍රයේ ආසනඝරය නමින් කැණීමක් කළ ආචාර්ය ගොඩකුඹුරේ මහතා බෝධිඝරයක සාධක සහිත ඉදිකිරීම් මතු කරගන්නා ලදි. එහි දී සංස්කෘතික අවධීන් 03ක් පිළිබඳ ව සාධක මත සඳහන් කරයි. ක්‍රිːපූː අවධීන්හි අක්‍ෂර සහිත කුඩා සෙල්ලිපි මෙම කැණීමේ දී මතු කරගෙන තිබේ. **(එම)**

අභයගිරි විහාරයේ වැඩසිටි භික්‍ෂු සමූහය අතර තවත් සුවිශේෂී කණ්ඩායමක් වශයෙන් පධානඝර වාසීන් වන පාංශකූලික භික්‍ෂූන් පෙන්වාදිය හැකි ය. මෙම භික්‍ෂූන් වැඩ සිටි බවට සාහිත්‍ය හා පුරාවිද්‍යා සාධක රැසකි. ඒ අතර පළමු වන සේන රාජ්‍ය සමයේ අභයගිරි විහාරයේ මෙම භික්‍ෂූන් සඳහා වෙන ම ම මුළුතැන් ගෙයක් සකසා දීමක් පිළිබඳ ව සඳහන් වේ **(මහාවංශය දෙවන කාණ්ඩය, 50, 76).** දෙවන සේන රාජ්‍ය අවධියේ පාංශකූලිකයන් වෙන ම ගුරුකුලයක් පිහිටවා ගැනීම සඳහා අභයගිරි විහාරයෙන් ඉවත් ව ගිය බව ද සඳහන් ය **(මහාවංශය 51 ː 52)** තෙවැනි උදය රජු දවස අමාත්‍යවරුන් පිරිසක් ජීවිතාරක්‍ෂව සඳහා තපෝවනයට ඇතුළු වූ පසු රජුට පක්‍ෂපාතී අමාත්‍ය පිරිසක් එහි ගොස් ඔවුන් ඝාතනය කිරීම හේතුවෙන් පාංශකූලික භික්‍ෂූන් තපෝවනය අතහැර රෝහණයට වැඩම කිරීමක් පිළිබඳ සිදුවීමක් ද වාර්තා වේ **(මහාවංශය දෙවන කාණ්ඩය, 53 පරි, 13-27)** අභයගිරි

ස්තූපයට බටහිරින් මහාචාර්ය ටී.ජී. කුලතුංගයන් විසින් හඳුනාගන්නා ලද සුදස්සන පධානඝරයත්, එහි වන ලෙන් සංකීර්ණයත් ඉහත මූලාශ්‍රයවල වන තපෝවනය බවට හඳුනාගෙන ඇත (**අභයගිරි පර්යේෂණ, 04 පරි, 37 පටු**). ආචාර්ය පරණවිතානයන් විසින් කියවා ප්‍රසිද්ධ කොට ඇති එහි වන පෙරමියන්කුලම නමින් හඳුන්වා ඇති සෙල්ලිපියේ පැහැදිලි ව මෙම විහාරය සුදස්සන නම් පියන්ගල් විහාරය බව සඳහන් කොට ඇත.(**EZ, VOL 1,P** 64-76)

අභයගිරි විහාරයේ භික්ෂුණීන් ද වැඩසිටි බවට සාධක වේ. එනම් සංඝමිත්තාගමනයත් සමඟ මෙ රට භික්ෂුණී ශාසනය ආරම්භ වුව ද, එහි නායකත්වය හා අනුශාසකත්වය හිමි වූයේ මහාවිහාරයට ය. එහෙත් නිකාය භේදයෙන් පසු ව අභයගිරි පාර්ශ්වයට අයත් භික්ෂුණී ආරාම පිළිබඳ ව පැහැදිලි සාධක අනාවරණය වේ. සිව්වන කාශ්‍යප අභයගිරි පුවරු ලිපියේ මෙම පාර්ශ්වයට අයත් මෙහෙණවරක පරිපාලන කටයුතු පිළිබඳ ව සඳහන් වේ **(EZ,VOL 1, P 47)**. මෙහි දැක්වෙන අනෙකුත් ආයතන මෙම විහාර භූමි පරිශ්‍රයෙහි ම වන උත්තරමූලය, කපාරාමූලය ආදි වන බැවින් උක්ත ආයතනය පමණක් දුර බැහැරක වන ආයතනයක් පිළිබඳ තොරතුරු විය නො හැකි ය. පස්වන මහින්ද රාජ්‍ය සමයේ මහාමහල්ලක මෙහෙණවර තැනූ බවත්, දන ශාලාවක් භික්ෂුණීන් වෙනුවෙන් නිර්මණය කළ බවත්, අඩු පොහොසත් මෙහෙණවරවල ගරාවැටීම් අළුත්වැඩියා කළ බවත්, සඳහන් වේ **(EZ, VOL l, P. 222)**. මෙම නිකායට අයත් උත්තර, අභය, සිලාමේඝ, මහින්ද හා ජෙට්ඨ යනාදී මෙහෙණවර ගණනාවක් පිළිබඳ ව මූලාශ්‍රය තොරතුරු ද වේ **(EZ, VOL.ll, P 19-25)**. එහෙත් පසු කාලීන ව මෙම කණ්ඩායම ක්‍රමයෙන් හීන ව යෑමට ප්‍රධාන හේතූන් ලෙස පැවති ආක්‍රමණ හා දුර්භික්ෂ කාලයන්හි පැවති දුෂ්කරතා බව මෙරට භික්ෂුණී ශාසනය පිළිබඳ ව අධ්‍යනයේ දී පැහැදිලි වේ. මේ වන විට සිදු කොට ඇති පුරාවිද්‍යා පර්යේෂණ අනුව ලංකාරාමය සහිත භූමිය අභයගිරි පාර්ශ්වයේ මෙහෙණවරක් බව හඳුනාගෙන තිබේ.

ශාසන ඉතිහාසයේ වැඩි වශයෙන් කතා බහට ලක් නො වන පිරිසක් ලෙස වන ද්‍රවිඩ භික්ෂූන් ද මෙම විහාරයේ වැඩ සිටි බවට විද්වත් අදහස් පවතී. ඒ අතර මෙරට ද්‍රවිඩ භික්ෂූන්ගේ ක්‍රියාකාරීත්වය සැලකිය යුතු මට්ටමක පැවතී ඇති අකාරය රණවීර ගුණවර්ධනයන් විසින් කරුණු පැහැදිලි කරයි (**සිවුර හා නගුල, 02 පරි. 47-48 පි.**). ද්‍රවිඩ භික්ෂූන් වෙනුවෙන් නිර්මාණය වූ විහාරාරාම පිළිබඳ ව ද මූලාශ්‍රය සාධක දැකගත හැකි ය.**(EZ, VOL. l, P. 246)**. අභයගිරි විහාරයේ ද ද්‍රවිඩ භික්ෂූන් වැඩසිටි බවට සාධක වශයෙන් 'දමිඩ ගහපති' සෙල්ලිපිය පිළබඳ ව දක්වන පරණවිතානයන් මෙය ද්‍රවිඩ වෙළඳ මධ්‍යස්ථානයක් ව පැවති බව ප්‍රකාශ කරයි. ඊට පිළිතුරු සපයන මහාචාර්ය ටී.ජී. කුලතුංගයන් මෙම ස්ථානය ද්‍රවිඩ වෙළඳ මධ්‍යස්ථානයක් විය නො හැකි බවටත්, මෙය ද්‍රවිඩ ගෘහපතීන් විසින් දමිළ භික්ෂූන් සඳහා සිදු කරන ලද පූජාවක් බවටත් තොරතුරු ඉදිරිපත් කරයි(**කුලතුංග, 397 පි.**). කපාරාමූලය වැනි විදේශීය භික්ෂූන් සඳහා මෙම ආරාමයෙහි නේවාසික පහසුකම් පැවති බවට ද පුරාවිද්‍යාත්මක තොරතුරු පවතී. එහෙයින් මෙරට හා විදේශීය පැවිද්දන් වෙනුවෙන් මෙම විහාරයේ ඉඩ ප්‍රස්ථාව විවෘත ව පැවති බව පැහැදිලි වේ.

## අභයගිරි සතර මූල

මෙම ආයතනය ආරම්භයේ දී එක් විහාරයක් පමණක් වුව ද ශීඝ්‍රයෙන් පරිපාලන, මානව සම්පත් හා භෞතික සම්පත් අතින් දියුණුවට පත් වීම දැකගත හැකි ය. ඊට රාජ්‍ය අනුග්‍රහය නො මද ව ලැබීම ඍජු ව බලපෑ බව පෙනේ. භික්ෂු පරිපාලනයේ හා කළමනාකරණයේ පහසු ව සඳහා විධිමත් පරිපාලන ක්‍රමයක් පැවති බවට සාධක මතු වේ. ඒ අතර මූලායතන එකකි. අභයගිරි විහාරයේ මූළ (හතරක්) 04ක් වශයෙන් කොටස් ව තිබී ඇත. එ නම්

1) උත්තරමූල
2) වහදු මූල
3) මහනෙත්පාමූල
4) කපාරාමූල වශයෙනි.


Vවන කශ්‍යප රජුගේ අභයගිරි සෙල්ලිපියේ කාව්‍යෝක්තියෙන් කරන ලද විහාර වර්ණනාවේ සතර මූලය රත්නප්‍රාසාදය වටා පිහිටා ඇති බව සඳහන් ය. **(EZ, VOL. l, PP. 64,76)** මෙම මූලයන් අතර උත්තරමූලය හා කපාරාමූලය හඳුනාගෙන ඇති අතර වහදු මූලය හා මහනෙත්පා මූල නිශ්චිත ව හඳුනාගෙන නොමැත. එහෙත් අභයගිරි ව්‍යවස්ථා ලිපිවන හතරවන මිහිඳු හා පස්වන කශ්‍යප පුවරුලිපිවල මෙම මූල පිළිබඳ සඳහන් ය.

උත්තරමූලය යනු කුපික්කලතිස්ස හිමියන් ඇතුළු භික්ෂූන් මුලින් ම වාසස්ථාන කරගත් පිරිවෙන් දොළසකින් යුතු ආරාමික සංකීර්ණය බව විද්වත් මතය යි. **(කුලතුංග,22)** අභයගිරි විහාරයේ මහානායක හිමියන්ගේ ආවාස ගොඩනැගිල්ල සහිත පරිශ්‍රය ද එම මූලයෙන් හඳුනාගෙන ඇත. (ඡායාරූප අංක) ඒ අනුව අභයගිරි විහාරය මුල් කාලීන ව 'උත්තර විහර' නමින් හඳුන්වා ඇති අතර ඊට හේතු වන්නට අති කරුණු පෙන්වා දෙන ටී. ජී. කුලතුංග උතුරින් පිහිටි උස් භූමිය යන අර්ථය පැහැදිලි කරයි. **(කුලතුංග, 191)** පසු කාලීන ව මූල වශයෙන් භාවිත කරන විට එම පැරණි මුල් භූමිය සහිත මූලය උත්තරමූලය ලෙස නම් වූ බව පැහැදිලි ය. අනුරාධපුර අවධියෙන් පසු ව ද උත්තරමූල භික්ෂු සමූහය පිළිබඳ තොරතුරු වාර්තා වේ. පොළොන්නරුවේ වෛලක්කාර ලිපියේහි දළදා වහන්සේගේ ආරක්ෂාව පැවරීමේ දී උත්තරමූලය පිළිබඳ ව සඳහන් වේ. කොට්ටේ අවධියේ වැඩසිටි තොටගමුවේ විජය බා පිරිවෙන්පති ශ්‍රී රාහුල හිමියන් ද උතුරු මූල රාහුල තෙරුන්ගේ මුණුපුරෙකු බව කාව්‍යසේකරයේ සඳහන් වේ. **(කාව්‍යසේකරය, 23 පද්‍යය)**

මහනෙත්පාමූලය හා වහදු මූලය පිළිබඳ පූර්ව අධ්‍යයනවල දී ''මහනෙත්පා මහදු අවසට්ද් මෙ සිරිත් කරනු ඉසා'' වශයෙන් පස් වන කශ්‍යප පුවරු ලිපියේ එන සඳහන අනුව මෙම වකවානුව දක්වා මහනෙත්පා හා වහදු මූල තත්වයට පත් ව නොමැති බව මහාචාර්ය රණවීර ගුණවර්ධන ප්‍රකාශ කරයි. **(ගුණවර්ධන, 302)** එසේ වුව ද පූජාවලිය ලියූ මයූරපාද පිරිවෙන්පති හා වීදාගම සංඝානන්ද පිරිවෙන්පති යන හිමිවරු මහනෙත්පාමූල භික්ෂු සමූහයට අයත් වූහ.**(කුලතුංග, 200-1)**

කපාරාමූලය පිළිබඳ ව ද පස්වන කාශ්‍යප ලිපියේ සඳහන් ය. ''තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි අබහය්ගිරි වෙහෙර කපාරාමුළට් සලමෙය්වන් පවු කරය් සගුන්' **(EZ, VOL.I,P.49)** වශයෙන් අභයගිරි කපාරාමූලයෙහි ඔහු සළමෙවන් පවු ප්‍රාසාදය කර වූ බව සඳහන් ය. මෙහි මහා කපාරා හා චූල කපාරා වශයෙන් කොටස් දෙකක් පැවති බව **පූජාවලියේ** සඳහන් ය. **(පූජාවලිය, පි. 103)** මෙම මහාචාර්ය පරණවිතාන විසින් සංඝනන්දි සංස්කෘත ලිපිය සොයාගැනීමත් සමග එහි අන්තර්ගත අනුව කපාරාමූලය කුට්ටම්පොකුණ අසළ පිහිටි නටබුන් වූ ගොඩනැගිලි සමූහය කපාරාමූලයට අයත් බව හඳුනාගන්නා ලදි. (EZ, VOL. V , Pt., pp 162-9) නමුත් එහි සීමාවන් මේ දක්වා හඳුනාගෙන නැත.


## පිරිවෙන්, ප්‍රාසාද, ආරාම ගොඩනැගිලි



**අභයගිරි පිරිවෙන් සැලස්මක්**

මෙම භූමියේ භික්ෂු ආරාමික කුටි විවිධ සැලසුම් අනුව නිර්මාණය කර ඇත. භික්ෂු කණ්ඩාම් සඳහා පමණක් ඉදිකළ කුටි දක්නට ඇත. මධ්‍යයේ ප්‍රධාන ගොඩනැඟිල්ල සිව්කොණ පරිවාර ගොඩනැගිලි 04කින් යුතු සංකීර්ණ පහත සඳහන් සැලැස්ම පොදුවේ දැකගත හැකි ය.

මෙහි මතුපිට සැලසුම අනුව ඩබ්. එස්. හෙට්ටිආරච්චි පඤ්චාවාස ලෙස මෙම සංකීර්ණ හැඳින්වීමට පෙළඹී ඇත. පසු ව මූලාශ්‍රය හා වාස්තුවිද්‍යා සාධක පැහැදිලි කරමින් මෙම සංකීර්ණ පිරිවෙන්, ප්‍රාසාද, ආරාම වශයෙන් ද හැඳින්වීම සුදුසු බව දක්වයි. **(කුලතංග, 205-6)** මෙම සංකීර්ණ අභයගිරි භික්ෂූන්ගේ නේවාසික පහසුකම් සපුරාලීම මෙන් ම පන්දහසක් (5000) පමණ වූ භික්ෂූන් වහන්සේ නිවැරදි ව පරිපාලන වශයෙන් කළමනාකරණය කරගැනීමට ද සැලසුම් කර ඇති බව පැහැදිලි කරගත හැකි ය.




අභයගිරි විහාර ප්‍රධාන කොටුදැල් සැලැස්ම



උත්තරමූලයේ මහානායක ආවාස ගොඩනැගිල්ල

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ හිමි, කොත්මලේ. 1969, **ලක්දිව සෙල්ලිපි**, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ:

**පූජාවලිය**, 1998, සංස්: සුරවීර, ඒ. වී. අභයවර්ධන එච්. ඒ. පී. පතිරණ, හර්බට්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල ප්‍රකාශන, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක:

**මහාවංශය**, 1996, පරිවර්තනය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ඛිත හිමි, දීපානී මුද්‍රණ ආයතනය, නුගේගොඩ:

**වංසත්ථප්පකාසිනී**, 1994, පරිවර්තනය, අකුරුටියේ අමරවංශ හිමි හා හේමචන්ද්‍ර දිසානායක, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය:

**ශිලාලේඛන සංග්‍රහය**, i වෙළුම, i කාණ්ඩය, 2000,පරිවර්තන, සද්ධාමංගල කරුණාරත්න, සංස්: දෙන් මර්තිනු ද සිල්වා වික්‍රමසිංහ, ඇම්. ඒ. ඩී. ලීට්, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**ෆාහියන් දේශාටක වාර්තාව**, 1999, පරිවර්තන. විමල් ජී. බලගල්ල, සී. ස. (පුද්) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව:

කරුණාරත්න ඩබ්. එස්. 1960, **සිංහල ශිලා ලේඛන**, ගුණසේන සහ සමාගම, කොළඹ:

කුලතුංග, ටී. ජී. 1998, **අභයගිරි විහාරය**, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ:

කුලතුංග, ටී. ජී. 2000, **මධ්‍ය කාලීන ලංකාවේ ආරක්ෂක සංවිධාන**, කර්තෘ ප්‍රකාශනයකි.

කුලතුංග, ටී. ජී. 2014, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රකාශන, කොළඹ:

ගුණවර්ධන, රණවීර. 1993, **සිවුර හා නගුල**, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය ප්‍රකාශන, කොළඹ 05:

**Epigraphia Zeilanica**, Vol 1. Department of Archaeaological Survey of Ceylon.

**Epigraphia Zeilanica**, Vol 2. Department of Archaeaological Survey of Ceylon.

**Epigraphia Zeilanica**, Vol 3. Department of Archaeaological Survey of Ceylon.

**Epigraphia Zeilanica**, Vol 4. Department of Archaeaological Survey of Ceylon.

Fa-hien (1965) **A record of Buddhistic kingdoms**, ed. James Legge New York: